## සී/ස කුරුවිට විවිධ සේවා සමූපකාර සමිතිය - කුරුවිට -

# තනතුරු පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීම

සී/ස කුරුවිට විවිධ සේවා සමූපකාර සමිතියේ තාවකාලික කොන්ත්‍රාත් මත වානිජ කළමනාකාර තනතුර සඳහා සමිති අභ්‍යන්තර කාර්ය මණ්ඩලයෙන් අයදුම්පත් කැඳවීමට ගරු අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කර ඇත. තමා විසින් පිළියෙල කර ගත් අයදුම්පත් පහත සඳහන් සහතිකවල පිටපත්ද සමඟ **2026.08.14** දිනට පෙර ''ගරු සභාපති, සී/ස කුරුවිට වි.සේ.ස. සමිතිය, කුරුවිට'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනැවිත් භාරදිය හැකි ය.

සුදුසුකම්:-

i. පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාණිජ/ කළමනාකරන/ ආර්ථික විද්‍යාව/ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

හෝ

ii. පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ/ ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ/ පිළිගත් ආයතනයකින් ලබාගත් අලෙවිකරණය/ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම සහ පිළිගත් වාණිජ/ කාර්මික ආයතනයක අලෙවිකරණ කටයුතු පිළිබඳ වසර 02ක පළපුරුද්ද තිබීම.

හෝ

iii. ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ කළමනාකරණය පිළිබඳ ජාතික (උසස් පෙළ) සහතිකය ලබා තිබීම සහ පිළිගත් වාණිජ/ කාර්මික ආයතනයක අලෙවිකරණ කටයුතු පිළිබඳ වසර 02ක පළපුරුද්ද තිබීම.

හෝ

iv. සබරගමු විශ්ව විද්‍යාලයේ සමුපකාර ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව තිබීම සහ පිළිගත් වාණිජ/ කාර්මික ආයතනයක විධායක තනතුරක වසර 03ක හෝ මෙහෙයුම් I මට්ටමේ තනතුරක වසර 08ක හෝ මෙහෙයුම් II මට්ටමේ තනතුරක වසර 10ක හෝ සතුටුදායක සේවා කාලයක් තිබීම.

හෝ

v. අ.පො.ස (උසස් පෙළ) වාණිජ අංශයෙන් සමත් වීම හා පිලිගත් වාණිජ/ කාර්මික ආයතනයක විධායක තනතුරක වසර 03ක හෝ මෙහෙයුම් I මට්ටමේ තනතුරක වසර 05ක හෝ මෙහෙයුම් II මට්ටමේ තනතුරක වසර 08 සතුටුදායක සේවා පලපුරුද්දක් තිබීම.

ඇපයः- වැටුප මෙන් 05 ගුණයක් සමිතියේ තැන්පත් කළයුතුය.

<u>අයදුම්පත් සමඟ එවියයුතු සහතික පත්‍ර</u>

01) උප්පැන්න සහතිකය
02) අධ්‍යාපන සහතික
03) ග්‍රාම නිලධාරී වාර්තාව
04) චරිත සහතික
05) පලපුරුද්ද පිළිබඳ සහතික
06) හැඳුනුම්පතේ ඡායා පිටපතක්
07) වෙනත් සුදුසුකම් දක්වෙන සහතික පිටපත්

මෙයට,
සමුපකාරික,

සභාපති
සී/ස කුරුවිට වි.සේ.ස. සමිතිය,
කුරුවිට.

සීමාසහිත කුරුවිට විවිධ
සමූපකාර සමිතිය
කුරුවිට

Scanned with CamScanner